ධනාත්මක සමාජයක් වෙනුවෙන් සෘණාත්මක ලේබල්කරණයන්ගෙන් වළකිමු!

මත්ද්‍රව්‍ය භාවිතය සමාජ ගැටළුවක් ලෙසින් විමසා බැලීමේදී, මත්ද්‍රව්‍ය මැඩපැවැත්වීම මෙන්ම, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන්ව නිසි පුනරුත්ථාපනයකින් පසුව සමාජය තුළට සාර්ථකව එක් කර ගැනීමද වැදගත් නොවන්නේ ද? එසේම, එහිදී මාධ්‍ය අත ද වගකීමක් නොතිබෙන්නේ ද?

සමාජයේ සිටින මත්ද්‍රව්‍ය භාවිතා කරන කොටස් සම්බන්ධයෙන් මාධ්‍ය සිදුකරන ඇතැම් සෘණාත්මක ලේබල්කරණයන් ඔස්සේ සිදුවිය හැකි හානිය සම්බන්ධයෙන්, Ethics Eye අපි මීට පෙරද පෙන්වා දී ඇත්තෙමු. උදාහරණ ලෙසට, "කුඩ්ඩා" වැනි ලේබල් ඔස්සේ, ඔවුන්ව සමාජය තුළ වඩ වඩාත් කොන් වීමත්, පුනරුත්ථාපනයෙන් පසුව හෝ නැවත සමාජයට එක් වීමට බාධා පැමිණීමත් සිදුවිය හැකි වේ.

ඒ අනුව,

1) සමාජය මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් කෙරෙහි දක්වන ගහර්ාව සහ කොන් කිරීම, "කුඩ්ඩා" යන යෙදුම ඔස්සේ තවත් තීව්‍ර නොවන්නේ ද? එවැනි ලේබල් කිරීම් හේතුවෙන්, මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් හට නිසි පුනරුත්ථාපනයකින් පසුව වුවද සමාජය හා එක් වීමට බාධා එල්ල නොවන්නේ ද?

2) ඒ වෙනුවට, "මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්", "මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන්" වැනි යෙදුම් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!